# සෞඛ්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## විදුලි කාර්මික - කර්මාන්ත (Electrician Industrial)

**(අ) බාහිර අයදුම්කරුවන්**

**i. අධ්‍යාපන**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන් ඒට ඇතුළත් වීම විශේෂ සුදුසුකමකි)

**ii. ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තෙකලා විදුලි කාර්මික (කර්මාන්තශාලා) ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් සමග වසර 2 කට නොඅඩු කර්මාන්තශාලා විදුලි කාර්මික සේවා පළපුරුද්ද ලබා තිබීම.

තෙකලා විදුලි සැපයුම පිළිබඳ දැන සිටීම, විදුලි මෝටර් සහ සැපයුම් පිළිබඳ දැන සිටීම (ස්ටාර් / ඩෙල්ටා) PLC දැනුම සහ ඉලෙක්ට්‍රොනික් පිළිබඳ දැන සිටීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි එමෙන්ම අදාළ ක්ෂේත්‍රයෙහි වසර 05 ක පළපුරුද්ද සහිතව රජයේ කාර්මික විද්‍යාලයක් විසින් පවත්වනු ලබන අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන කාර්මික කුසලතා / වෘත්තීය ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වන ප්‍රාථමික ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි සේවකයෝ අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

**(ඇ) වයස**

වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(ඈ) වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්පත් තමා විසින්ම සකස් කොට සියලු තොරතුරු හා සුදුසුකම් ඇතුළත් කර අයදුම්පත් 2022.11.17 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "විදුලි කාර්මික – කර්මාන්ත" යනුවෙන් පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.

**සභාපති, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,**
**තැ.පෙ. 17, කපුවත්ත, ජා-ඇල.**